## 398 මංගල සිරි මවලා

මංගල සිරි මවලා ඔබෙ ගුණ පසසාලා
ඔබ දෙපයේ වැටිලා මවේ ඔබෙ සරණේ එමු

ජය ගී ගයලා වැඳ වැටිලා ඔබ වෙත නෙත් යොමලා
දෝත නගාලා අසිරි පතා ඔබ දෙපතුල වැටෙමු

කරදර බාධක අතරතුරේ ආසිරි වස්වාලා
නත්වර ලැබදී අප සුරැකී ඔබ දෙපතුල වැටෙමු

ඔබ සරණය පා ඔබ වෙත ආ දස දහසක් ජනයා
ඔබ හට තුති දී ගීත ගයා ඔබ දෙපතුල වැටෙමු

සැම හට සාමය නිති ලැබ දී නපුරෙන් මුදවාලා
ඔබ අප සැමදා සුර මවෙනී වඳිනෙමු මැණියනේ

ඉර හඳ පවතින සැම දිනේ ඔබ අප මැණියවේ
ඔබ සළු සෙවණේ අප සැමදා රැකගනු මැණියනේ